**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ලේඛකාධිකාරී තනතුරට (සීමිත) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම</u>**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ලේඛකාධිකාරී තනතුරට (සීමිත) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.** <u>අධ්‍යාපන සුදුසුකම්</u> - අදාල නොවේ

**2.** <u>වෘත්තීය සුදුසුකම්</u> - අදාල නොවේ

**3.** <u>පළපුරුද්ද</u> - කොළඹ මහ නගර සභාවේ මහජන ආධාර දෙපාර්තමේනතුවේ මාණ්ඩලික සහකාර තනතුරෙහි නිලධාරියෙකු වීම

**4.** <u>කායික සුදුසුකම්</u> - තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

**5.** <u>වැටුප -</u> මෙම තනතුරට හිමි වැටුප් කේත අංකය MN 7 -2016 වේ.
වැටුප් පරිමාණය - රු. 41,580– 11 x 755 -11x 660 – 18 x1030 – 68425 /- (රා.පරි.ච.03/2016 අනුව)

**6.** <u>සේවා කොන්දේසි</u> - අනුමත බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

**7.** <u>වයස් සීමාව</u> - බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු වූවන් බැවින් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**8.** <u>බඳවා ගැනීමේ ක්‍රමය -</u> ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකප්‍රතිඵල අනුව 100 % කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

**9.** <u>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය</u>

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | තොරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| i | සහන නිලධාරී I / මාණ්ඩලික සහකාර තනතුරුවල සේවා කාලය සඳහා<br>(වසරකට ලකුණු 05 බැගින් උපරිමය වසර 06 ක් සඳහා ) | 30 | 50 % |
| ii | සහන නිලධාරී I / මාණ්ඩලික සහකාර තනතුරුවල දී කරන ලද විශේෂ වැඩ සටහන් සඳහා<br>• ව්‍යාපෘති වාර්තා<br>• ඇගයීම් ලිපි<br>• තොරතුරු පත්‍රිකා<br>• දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ සහතික<br>(සාක්ෂි මඟින් ඉදිරිපත් කල යුතු අතර එක් අංශයක් සඳහා ලකුණු 05 බැගින් උපරිමය අවස්ථා 05 සඳහා) | 25 | |
| iii | කාර්ය සාධන ඇගයීම<br>( උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 5 සඳහා )<br>ඉතා හොඳයි - ලකුණු 08<br>හොඳයි - ලකුණු 06<br>සතුටුදායකයි - ලකුණු 03<br>අසතුටුදායකයි - ලකුණු 00 | 40 | |
| iv | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |

**10.** <u>වෙනත්</u> **-** තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය

**11.** **අයදුම් කිරීමේ ක්‍රමය**

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවටද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද,ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය.නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලනොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේනිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත..

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය**2020.03.06** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ"ලේකම්,බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජනජය සිටි ගොඩනැගිල්ල , නාවල පාර , රාජගිරිය"වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ලේඛකාධිකාරී තනතුරට බඳවා ගැනීමේ (සීමිත) අයදුම් පත්‍රය** යන්න පැහැදිලිලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

(ඇ) අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවූ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 07 ක් ගතවූ පසුවත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද , අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය , ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම්කරන තනතුරෙහි නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

(ඈ) සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනලද නිතීරීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත

**12.** **සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:**

අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරදී හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී,ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.අයදුම්කරු විසින් ඉදිරිපත්කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්,එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්,ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

**13**. සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

**14**. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

**15**. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය වන / නොවන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත.
2020.**0**1.

## ආදර්ශ අයදුම්පත්‍රය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ලේඛකාධිකාරී තනතුරට (සීමිත) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

**01** 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -.......................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):

..................................................................................................................................................

(උදා: H.M.S.K.GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්)-..........................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**02** 2.1 දැනට දරණ තනතුර : .

.....................................................................................................................

2.2 එම තනතුර ස්ථිරද, තාවකාලිකද ,අනියම්ද යන්න : …………………………………………….......

2.3 එම තනතුරට පත්වීමේ දිනය : ……………………………………………………………......

2.4 සේවය ස්ථිර කල දිනය : ………………………………………………………………......

2.5 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක කාලසීමාව තුළ විනය ක්‍රියාමාර්ගයට ලක් වී තිබේද? - ඔව්/ නැත

2.6 ඉහත 2.5 ට පිළිතුර " ඔව් " නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න

..................................................................................................................................................

2.7 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කල දිනය : ……………………………............

2.8 සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ……………………………………………………...........

2.9 වැටුප් බන්ඩය : ..........................................................................................................................

2.10 පලපුරුද්ද : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 03 අනුව සේවා පලපුරුද්ද පිළිබඳ පහත වගුව සම්පූර්ණ කරන්න )

| දරණ ලද තනතුර | සේවා ස්ථානය | වැටුප් බණ්ඩය | පළපුරුද්ද |
|---|---|---|---|
| | | | |
| | | | |

**03** 3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින් )...........................................................................................

..................................................................................................................................................

ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................................

..................................................................................................................................................

3.2 දූරකථන අංකය:

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | රාජකාරී |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | ජංගම |

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දූරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දූරකථන අංකයක් සඳහන් කරන්න.

**04** ස්ත්‍රී/පුරුෂ භාවය-(අදාළ කොටුව තුළ √ යොදන්න)

පුරුෂ - ☐ ස්ත්‍රී ☐

**05** 5.1 විවාහක/අවිවාහක බව- (විවාහක-2, අවිවාහක- 1) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න )

5.2 උපන් දිනය වර්ෂ ය ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

5.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු: ................ මාස............ දින ...............

**06** 2020.03.06 දිනට පූර්වාසන්න වසර 05 තුළ දැනට දරණ තනතුරේ,

i. සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ..............................................................................

ii. වැටුප් රහිත නිවාඩු/වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද? ....................................................

iii. සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබේද? ............................................................

iv. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද?, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කරතිබේද?
..........................................................................................................................

v. ඉහත iv සඳහා පිළිතුර " ඔව් "නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. ........................................
..........................................................................................................................

**07** **<u>අයදුම්කරුගේ සහතිකය</u>**

………………………..……………………………………………………………………………………

…………………………………………………………………… වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ලේඛකාධිකාරී තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයාකූල කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය ....................................... ....................................................................

**09** **<u>ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>**

( අනවශ්‍ය වචන කපා හරින්න)

.….......................................................... මහතා/මිය/මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ….................................. දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ....................................... තනතුරක සේවය කරන බවත් ............................. වැටුප් බන්ධය යටතේ වැටුප් ලබන බවත් ................................ දින සිට සේවය ස්ථිර කර ඇති / නැති බවත් .......................... දිනට පූර්වාසන්න වසර 05 ක කාල සීමාව තුළ සියලුම වැටුප් වර්ධක නිසි පරිදි උපයාගෙන ඇති/නැති බවත් , වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති/නැති බවත්, ඔහුට / ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති/ඇති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති / ඇති බවත් සහතික කරමි.

2. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බව සහතික කරන අතර බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ මහජන ආධාර දෙපාර්තමේන්තුවේ ලේඛකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව මෙම නිලධාරියා / නිලධාරිනිය සුදුසුකම් සපුරා ඇති බව ද නිර්දේශ කරමි.

දිනය …............................. …..............................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

## 10. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ මහජන ආධාර දෙපාර්තමේන්තුවේ ලේඛකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව ............................................ මහතා/මිය/මෙනවිය සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත නිර්දේශ කරමි.

දිනය ……............................ ……..........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

## 11. අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ නිර්දේශය

ඉහත අයදුම්පත නිර්දේශ කරමි.

දිනය ……............................... ……..........................................................

අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ අත්සන හා නිල මුද්‍රාව